සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 9 - ශ්‍රේණිය

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02යි.

උපදෙස්

- පාසල තුළ ව්‍යාපෘති සම්බන්ධව කරනු ලැබූ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ලකුණු 20ක් හිමි වේ.
- බහුවරණ 20 සඳහා ලකුණු 40 ක් ද ව්‍යුහගත ප්‍රශ්න 03ක් තෝරාගෙන ලිවීමෙන් ලකුණු 40 ක් ලබා දේ.

### I - කොටස

(01) බහු වාර්ෂික ශාකවල අතු සහ මුල් දීර්ඝ කාලයක් තිස්සේ කප්පාදු කරමින් නඩත්තු කිරීමෙන් ලබා ගන්නා කුඩා ශාක හඳුන්වන්නේ
(1) බොන්සායි ලෙසයි (2) ක්ෂුද්‍රරූපි උද්‍යාන ලෙසයි (3) කොකිඩාමා ලෙසයි (4) සිඟිති උද්‍යාන ලෙසයි

(02) අසුරන ලද එළවළු, පළතුරු බීජ සහ බඳුන්ගත පැල වර්ග විකිණීමේ දී බෝගවල අගය වැඩි කර ගතහැකි ක්‍රමයකි.
(1) නොමිලේ බීජ හා පැල ලබාදීමෙන්
(2) අඩු මිලට බීජ හා පැල ලබාදීමෙන්
(3) බෝගවලට අදාළ මහා පිළිවෙත් අඩංගු පත්‍රිකාවක් ලබා දීමෙන්
(4) බෝගය සමග වෙනත් බෝගයක් ලබා දීමෙන්

(03) අඛණ්ඩව මුගුණුවැන්න අස්වැන්නක් ලබා ගැනීමට මුගුණුවැන්න ඉත්තක් දඬු වර්ග කීයකට වෙන් කර ගත හැකිද?
(1) දඬු වර්ග 2 (2) දඬු වර්ග 5 (3) දඬු වර්ග 4 (4) දඬු වර්ග 3

(04) සජීවී කලා නිර්මාණ (Live Art Gardening) තැබීමට සුදුසුම ස්ථානයක් වන්නේ
(1) කෑම මේසය මත (2) නිවසේ මුල්ලක
(3) බිත්තියක එල්ලා තැබීම (4) විසිත්ත කාමරයේ ගෙබිම මත

(05) ඉහළ අස්වනු අපේක්ෂාවෙන් යොදනු ලබන උපාය මාර්ගයක් නොවන්නේ
(1) නව බෝග ප්‍රභේද අභිජනනය කිරීම (2) අධික ලෙස රසායනික පොහොර භාවිතය
(3) අධික ලෙස පළිබෝධනාශක භාවිතය (4) වගා ණය ලබා දීම

(06) අඛණ්ඩව වගා කිරීමෙන් වගාවට හිතකර පාංශු ගුණාංග පිරිහීම සිදු වේ. එවිට පුනරුත්ථාපන බෝගයක් ලෙස සිටුවිය හැකි වන්නේ
(1) ගෝතමාලා (2) ගොටුකොළ
(3) ග්ලිරිසීඩියා (4) පියුරේරියා

(07) ආහාර මූලික කරගත් කර්මාන්තයක් සැලසුම් කිරීමේදී
(1) ප්‍රදේශයේ පවතින සුලබ අමුද්‍රව්‍ය යොදාගත යුතුය
(2) ප්‍රදේශයේ පවතින දුලබ අමුද්‍රව්‍ය යොදා ගත යුතුය
(3) ආනයනික අමුද්‍රව්‍ය යොදාගත යුතුය
(4) වැඩි පාරිභෝගික ඉල්ලුමක් නොමැති ආහාර ද්‍රව්‍ය හඳුනාගත යුතුය

(08) ආහාරවල බහුලව දක්නට ලැබෙන ස්වභාවික වර්ණ යුගලයක් වන්නේ
(1) රතු සහ කළු (2) කහ සහ කොළ (3) සුදු සහ කළු (4) කොළ සහ කළු

(09) වාහන එන්ජින්වලින් මුදාහැරෙන පරිසර දූෂණයට හේතුවන වායු වර්ග දෙකක් වන්නේ
(1) ඔක්සිජන් හා නයිට්‍රජන් (2) සෝඩියම් හා ක්ලෝරීන්
(3) මීතේන් හා සෝඩියම් (4) කාබන් මොනොක්සයිඩ් හා නයිට්‍රස්ඔක්සයිඩ්

(10) පහත දැක්වෙන ලාංඡන දෙකෙන් අදහස් වන්නේ






(1) ගස් වගා කළ යුතු බවයි (2) පරිසර හිතකාමී බවයි
(3) ගස් ආරක්ෂා කළ යුතු බවයි (4) හරිත පරිසරයක් බවයි

(11) ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී ප්‍රථමයෙන් ම ඔබ කළ යුත්තේ
(1) නිර්මාණ සාරාංශය සකස් කිරීමයි
(2) පිරිවිතර සකස් කිරීමය
(3) ගැටලුමය අවස්ථාව හා ඊට විසඳුම් ක්‍රියාමාර්ග සෙවීම
(4) කාලරාමුව සැකසීමයි

(12) කුඩා ව්‍යාපාරවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් වන්නේ කුමක්ද?
(1) විශාල සේවක සංඛ්‍යාවක් සිටීම (2) මහා පරිමාණ යන්ත්‍රසූත්‍ර භාවිතා නොකිරීම
(3) වෙළඳ පොළ සීමාරහිත වීම (4) විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබීම

(13) පසුගිය දශක කිහිපය තුළ සිට ම ව්‍යාපාරික ක්ෂේත්‍රයට කාන්තා ව්‍යවසායකයන්ගේ නැඹුරුතාව වැඩි වී ඇත. එයට හේතුවක් වන්නේ
(1) ගේදොර වැඩවලින් නිදහස් වීමේ අරමුණයි
(2) පවුලේ ආදායම් තත්ත්වය වැඩිකර ගැනීමේ අවශ්‍යතාවයයි
(3) නිවසේ සෙසු අය කරන බලපෑමයි
(4) කාන්තා අධ්‍යාපන මට්ටම පහළ යාමයි

(14) ව්‍යාපාරයක මුදල් ලේඛනයක් යනු
(1) ආයෝජනය කරන මුදල් සටහන් කර තබන ලේඛනයයි
(2) ව්‍යාපාරයේ වියදම් පෙන්නුම් කරන ලේඛනයයි
(3) ව්‍යාපාරයේ ලාභ අලාභ සොයාගන්නා ලේඛනයයි
(4) ව්‍යාපාරයේ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සටහන් කරන ලේඛනයයි

(15) ව්‍යාපාරික කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා විවිධ සේවා සහාය වේ. එම සේවා හඳුන්වනුයේ
(1) ප්‍රචාරණ සේවා ලෙසයි (2) නිෂ්පාදන සේවා ලෙසයි
(3) උපකාරක සේවා ලෙසය (4) රාජ්‍ය සේවා ලෙසයි

(16) සියලුම බැංකුවල බැංකුකරුවා ලෙස ක්‍රියාත්මක වන්නේ
(1) මහජන බැංකුවයි (2) ලංකා බැංකුවයි
(3) ජාතික ඉතිරි කිරීමේ බැංකුවයි (4) ශ්‍රී ලංකා මහ බැංකුවයි

(17) ධාරිත්‍රකයක (Capacitors) සංකේතය වන්නේ

(1) 
(2) 
(3) 
(4) 

18) ජල මාර්ගයකින් $90^0$ කින් දිශාව වෙනස්කර තවත් ජලමාර්ගයක් ලබා ගැනීමට භාවිතා කරන උපාංගයක් වන්නේ
(1) T සන්ධියයි (2) කරාම කෙවෙනිය
(3) වැලමිට නැම්ම (4) සමාන කෙවෙනිය

(19) ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල විවිධ ආහාර වර්ග සුලබ වශයෙන් දක්නට ලැබේ. දකුණු පළාතේ සුලබ වශයෙන් දක්නට ඇති ආහාර වර්ග දෙක කුමක්ද?

(1) මාළු හා මී කිරි
(2) මැංගුස් හා දූරියන්
(3) ස්ට්‍රෝබෙරි හා අර්තාපල්
(4) රතුලූනු හා තල්

(20) නව ව්‍යාපාරයක් ඇරඹීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙන රාජ්‍ය ආයතනයකි

(1) තරුණසේවා සභාව
(2) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
(3) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
(4) අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## II - කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(01) (i) වර්තමානයේ කාර්ය බහුලතාවය මත එදිනෙදා ගෘහ කාර්යන් කර ගැනීමට යොදා ගන්නා නවීන ගෘහ උපකරණ 5ක් නම් කරන්න (ලකුණු 5)

(ii) ඔබ නම් කළ ගෘහ උපකරණවල ඇතිවිය හැකි සරල දෝෂ 03ක් නම් කරන්න. (ලකුණු 5)

(iii) තාක්ෂණික විෂය දැනුමක් ඇති සිසුන් වන ඔබට පාසලේදී එම සේවය ලබාදිය හැකි අවස්ථා 04ක් නම් කරන්න. (ලකුණු 4)

(iv) සරල තාක්ෂණික ශිල්පීය ක්‍රම හා උපකරණ යොදා ගනිමින් පොල්ලෙලි හා පොල්කටු භාවිතා කරමින් කළ හැකි සරල නිර්මාණ 06ක් නම් කරන්න. (ලකුණු 6)

(මුළු ලකුණු 20)

(02) (i) බෝග වගාව පිණිස වනාන්තර හෙළි කිරීම නිසා වන ආවරණ හීන වී යයි. මේ මඟින් සිදුවන අහිතකර බලපෑම් 03ක් නම් කරන්න. (ලකුණු 6)

(ii) පාංශු බාදනය හා පාංශු හායනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(මුළු ලකුණු 10)

(03) (i) ව්‍යවසායකත්වය යනු කුමක්ද? (ලකුණු 2)

(ii) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 03ක් නම් කරන්න (ලකුණු 6)

(iii) ඉන් එක් ගති ලක්ෂනයක් කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 2)

(මුළු ලකුණු 10)

(04) (i) ආහාර විවිධාංගීකරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් නම් කරන්න. (ලකුණු 5)

(ii) ඔබ කැමති අමුද්‍රව්‍යයක් ඇසුරෙන් ආහාර විවිධාංගීකරණය නිදසුනක් මඟින් ඉදිරිපත් කරන්න (ලකුණු 5)

(මුළු ලකුණු 10)